පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 07

අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- ගණිතය

පාසලේ නම : ....

ඇතුළත්වීමේ අංකය : ....

කාලය : පැය 02 යි

◈ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ සපයා ඇති ඉඩ තුළ ලියන්න

01. සුළු කරන්න. $20 - 5 \times 3$

02. 125, පාදය පහ වූ දර්ශක අංකනයෙන් ලියන්න.

03. $A = \{$5 ත් 50 ත් අතර, 5 හි ගුණාකාර$\}$ මෙම කුලකයේ අවයව සඟල වරහන් තුළ ලිවීමෙන්, ලියා දක්වන්න.

04. 1 : 50 000 පරිමාණයට අඳින සිතියමක ස්ථාන දෙකක් අතර දුර 8cm කින් දැක්වේ. එම ස්ථාන දෙක අතර සැබෑ දුර සොයන්න.

05. දක්වා ඇති සංඛ්‍යාව 9 න් ඉතිරිනැතිව බෙදේ නම්, එහි එකස්ථානයට යෙදිය යුතු ඉලක්කම හිස්තැන මත ලියන්න

111 220 00....

06. සමාන්තර සරල රේඛා ඇඳීම සඳහා භාවිතාකරන ගණිත උපකරණවල නම් දෙකක් හිස්තැන් මත ලියන්න.

i. ....   ii. ....

07. 0.35 භාගයක් ලෙස ලියා, සරල ම ආකාරයෙන් ප්‍රකාශ කරන්න.

08. මෙහි දැක්වෙන ශුද්ධ ටෙසලාකරණ තෝරා යටින් ඉරි අඳින්න.

i.  ii.  iii.  iv. 

09. රූපයේ දී ඇති තොරතුරුවලට අනුව O කේන්ද්‍රය වූ වෘත්තයේ විෂ්කම්භයේ දිග සොයන්න



10. රූපයේ දක්වා ඇති කෝණවල නම් හිස්තැන් මත ලියන්න.

a = ...

b = ...



11. 21 වෙනි සියවසේ ආරම්භක දිනය කවදාද ?

12. සුළු කරන්න. (-11) + (+5)

13. පහත දක්වා ඇති සිදුවීම් අතරින් අහඹු සිදුවීම් ඉදිරියේ ඇති කොටු තුල ✓ ලකුණු යොදන්න.

i. අමාවක දිනක චන්ද්‍රයා දිස්වීම. ☐

ii. පන්තියට ඊලගට ඇතුල්වන ළමයා, පිරිමි ළමයකු වීම. ☐

iii. අද දිනය තුල වැසි ලැබීම. ☐

iv. නැගෙනහිරෙන් ඉර උදාවීම. ☐

14.

l	ml
6	15
- 2	78

15. දක්වා ඇති රූප අතරින් අවතල බහුඅස්‍ර තෝරා යටින් ඉරි අඳින්න.

i.  ii. iii.  iv 

16. බිස්කට් පැකට්ටුවක ස්කන්ධය 50g 170mg වේ. එවැනි බිස්කට් පැකට් අටක ස්කන්ධය සොයන්න.

17. සුළු කරන්න $123.45 \div 100$

18. $3m$ දිග රිබන් පටියකින් $1m$ $17cm$ ක කොටසක් කපා ඉවත්කළ පසු ඉතිරිවන කොටසේ දිග සොයන්න.

19. දක්වා ඇති ඝනකාභයේ පරිමාව කීයද?



20. දී ඇති ඍජුකෝණාස්‍රයේ පරිමිතිය සඳහා ප්‍රකාශනයක් ලියා, එය සුළු කර දක්වන්න.



$\overline{\quad\quad}$
40

ii කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.
- මෙහි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට ඉඩකට ප්‍රමාණවත් නොවන්නේ නම් පමණක් ඒ සඳහා අමතර කඩදාසි භාවිතා කරන්න.

01. (*a*). පහත දක්වා ඇති කාටිසීය තලය හොඳින් අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i. A , B, D ලක්ෂවල ඛණ්ඩාංක නිවැරදිව ලියන්න.

A = ...

B = ...

E = ... (ල 03)

ii. A, B, C, D, E ලක්ෂ අනුපිළිවෙලින් යා කරන්න. (ල 01)

iii. AE සරල රේඛාව කඩ ඉරකින් යා කරන්න (ල. 01)

iv. ඉහත ඔබ ඇඳි AE කඩ ඉර සමමිති අක්ෂයක් ලෙස සලකා ද්වීපාර්ශ්වික තල රූපයක් ලැබෙන සේ දී ඇති කාටිසීයතලය මත ඉතිරි කොටස සම්පූර්ණ කරන්න (ල. 02)

(*b*). ඔබ පන්තියේදී කළ ඝන වස්තු පාඩම සිහිපත් කරන්න.



i. ඉදිරියෙන් දක්වා ඇති පතරම භාවිතයෙන් සෑදිය හැකි ඝන වස්තුවේ නම ලියන්න. .... (ල. 01)

ii. එම ඝන වස්තුවේ මුහුණත්, දාර, ශීර්ෂ ගණන වෙන වෙනම ලියා දක්වන්න

මුහුණත් ගණන = ...

දාර ගණන = ...

ශීර්ෂ ගණන = ... (ල. 03)

(*c*).

i. ඔබ ඉහත පතරම භාවිතයෙන් සාදාගත් ඝනවස්තුවේ ත්‍රිකෝණාකාර මුහුණතට සමාන මුහුණත් ඇති සවිධි චතුස්තලයක් ඔබට සපයා ඇත. එම චතුස්තලය ඔබ ඉහත සාදන ලද ඝන වස්තුවේ ත්‍රිකෝණාකාර මුහුණතට සමපාත වනසේ තබා අලවා ගත් පසු ලැබෙන සංයුක්ත ඝන වස්තුවේ මුහුණත්, දාර, ශීර්ෂ ගණන වෙන වෙනම ලියා දක්වන්න (ල. 03)

මුහුණත් ගණන = ...

දාර ගණන = ...

ශීර්ෂ ගණන = ...

ii. ඉහත සෑදි සංයුක්ත ඝණවස්තුව ඔයිලර් සම්බන්ධයට ගැලපෙන බව පෙන්වන්න. (ල. 03)

16

02. i. කවකටුව භාවිතයෙන් අරය 5 cm වන වෘත්තයක් නිර්මාණය කර එහි කේන්ද්‍රය O ලෙස නම් කරන්න. (ල. 02)

ii. ඔබ ඇඳි වෘත්තය මත කවකටුව භාවිතයෙන් A, B, C, D, E, F සවිධි ෂඩාස්‍රය නිර්මාණය කරන්න (ල. 05)

iii. ෂඩාස්‍රයේ A, C, E ලක්ෂ ත්‍රිකෝණයක් ලැබෙන සේ යා කරන්න. (ල. 01)

iv. ACE ත්‍රිකෝණය පාද අනුව කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද? .... (ල 01)

v. $A\hat{C}E$ කෝණයේ අගය මැන ලියන්න. .... (ල. 02)

(අදාල නිර්මාණයට පහත සපයා ඇති ඉඩ ප්‍රයෝජනයට ගන්න)

11

03. i. $5\frac{2}{3}$ විෂම භාගයක් ලෙස ලියන්න. (ල. 2)

ii. පිළිතුර ලබාගත් ආකාරය දක්වමින් හිස්තැන සඳහා $<$, $>$ මෙම සලකුණුවලින් සුදුසු සලකුණ යොදන්න

$5\frac{2}{3}$ ..... $5\frac{3}{5}$ (ල. 3)

iii. $\frac{2}{3}+\frac{1}{2}+\frac{5}{6}$ සුළු කරන්න (ල. 3)

v. $5\frac{2}{3}-1\frac{5}{6}$ සුළු කරන්න (ල. 3)

11

---

04. (a)

i. මෙහි දැක්වෙන සෘජුකෝණාස්‍රයේ දිග, පළලට වඩා මීටර් 5 ක් වැඩිවේ. මෙහි පළල මීටර් a වේ. එහි දිග සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න . (ල. 01)



ii. එම සෘජුකෝණාස්‍රයේ පරිමිතිය P නම්, පරිමිතිය දැක්වීමට වීජීය පද ඇතුළත් ප්‍රකාශනයක් ලියා සුළු කරන්න (ල. 3)

iii. $a = 8\ m$ නම් සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න. (ල. 2)

(b)

i. පොතක මිල රු. x වේ. එවැනි පොත් තුනක් හා රු. 25 ක් වන පෑන් දෙකක් මිලට ගැනීමට අවශ්‍ය වන මුළු මුදල දැක්වීමට x අඩංගු ප්‍රකාශනයක් ලියන්න. .... (ල. 02)

ii. ඉහත ද්‍රව්‍ය සියල්ල මිලට ගැනීමට වැය වූ මුළු මුදල රු. 450 ක් නම්, ඒ සඳහා සමීකරණයක් ගොඩනගා එය විසඳීමෙන් පොතක මිල සොයන්න. (ල. 03)

11

05. වසර කිහිපයකදී කන්ද ලඟ පාසලේ සමානා්‍ය පෙළ විභාගයෙන් ගණිතය, විද්‍යාව හා සිංහල යන විෂයන් සමත් සිසුන් ගණන පිළිබඳ තොරතුරු ඇතුලත් අසම්පූර්ණ බහු තීර ප්‍රස්තාරයක් පහත දැක්වේ.



i. 2020 වර්ෂයේ සමත් වූ සිසුන් පහත පරිදි වේ.

සිංහල සමත් සිසුන් 80, ගණිතය සමත් සිසුන් 85, විද්‍යාව සමත් සිසුන් 50

මෙම තොරතුරු ඉහත ප්‍රස්තාරය මත නිවැරදිව නිරූපනය කරන්න. (ල. 03)

ii. වසරක් පාසා සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය වී ඇත්තේ කවර විෂයේ ද?

(ල. 02)

iii. වසරක් පාසා සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වී ඇත්තේ කවර විෂයේ ද? (ල. 02)

iv. 2019 වර්ෂයේ විද්‍යා විෂයට වඩා ගණිතය විෂය සමත් සිසුන් ගණන කොපමණ ද? (ල. 02)

v. වසර 3 තුල ම විද්‍යාව විෂය සමත් වූ මුළු සිසුන් ගණන කීයද ? (ල. 02)

11

06. මෙහි ABCDEF ලෙස දක්වා ඇත්තේ මල් පාත්තියකි. මෙම මල් පාත්තිය වටා ගඩොල් බැම්මක් සකස් කිරීමට යෝජිතය.

i. CD, BC, දිග සෙන්ටි මීටර්වලින් කොපමණද?

CD = ...

BC = ...

(ල. 02)



ii. ගඩෝල් බැම්මේ මුළු දිග සොයන්න. (ල. 02)

iii. මල් පාත්තියේ මුළු වර්ගඵලය ගණනය කරන්න. (ල. 05)

11

---

07. i. හිස් තැන පුරවන්න. 2 : 5 = ... : 15 (ල. 01)

ii. එක්කරා පොහොර වර්ගයක් සෑදීම සඳහා පොස්පරස් හා පොටෑසියම් යන මූල ද්‍රව්‍ය 5 : 3 අනුපාතයට මිශ්‍ර කරයි.

පොහොර මිශ්‍රණයේ පොටෑසියම්වල ස්කන්ධය 600 g නම්, මිශ්‍රනයේ මුළු ස්කන්ධය සොයන්න

(ල 04)

iii. උසස් පෙළ සිසුන් කලා, වාණිජ, ගණිත අංශ සඳහා 2 : 5 : 3 අනුපාතයට බඳවාගන්නා ලදි. උසස් පෙළ සඳහා ඉහත විෂය ධාරාවන්ගෙන් ඇතුලත් කළ මුළු සිසුන් 240 ක් නම් ඒ ඒ විෂය ධාරවලට ඇතුලත් වූ සිසුන් ප්‍රමාණයන් වෙන වෙනම සොයන්න. (ල 06)

11

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 07

අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- ගණිතය

පිළිතුරු පත්‍රය

පාසලේ නම : ....

ඇතුළත්වීමේ අංකය : ....

කාලය : පැය 02 යි

◈ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ සපයා ඇති ඉඩ තුල ලියන්න

01. සුළු කරන්න. $20 - 5 \times 3$

$= 20 - 15$ —— (1)

$= 5$ —— (1)

02. 125, පාදය පහ වූ දර්ශක අංකනයෙන් ලියන්න.

$125 = 5^3$ —— (2)

03. $A = \{$5 ත් 50 ත් අතර, 5 හි ගුණාකාර$\}$ මෙම කුලකයේ අවයව සඟල වරහන් තුළ ලිවීමෙන්, ලියා දක්වන්න.

$A = \{10, 15, 20, 25, 30, 35, 40, 45\}$ —— (2)

04. 1 : 50 000 පරිමාණයට අඳින සිතියමක ස්ථාන දෙකක් අතර දුර 8cm කින් දක්වේ. එම ස්ථාන දෙක අතර සැබෑ දුර සොයන්න.

$8cm = 8 \times 50\,000 = 400\,000cm$ **හෝ** $4km$ —— (2)

05. දක්වා ඇති සංඛ්‍යාව 9 න් ඉතිරිනැතිව බෙදේ නම්, එහි එකස්ථානයට යෙදිය යුතු ඉලක්කම හිස්තැන මත ලියන්න

111 220 00**2**. —— (2)

06. සමාන්තර සරල රේඛා ඇඳීම සඳහා භාවිතාකරන ගණිත උපකරණ දෙකක් හිස්තැන් මත ලියන්න.

i. **සරල දාරය** —— (1) ii. **විහිත චතුරස්‍රය** —— (1)

07. 0.35 භාගයක් ලෙස ලියා, සරල ම ආකාරයෙන් ප්‍රකාශ කරන්න.

$\frac{35}{100} = \frac{7}{20}$ (1) (1)

08. මෙහි දක්වෙන ශුද්ධ ටෙසලාකරණ තෝරා යටින් ඉරි අඳින්න.

i. 

ii.  —— (1)

iii. 

iv.  —— (1)

නිවැරදි පිළිතුරු දෙකට ලකුණු 2 යි
නිවැරදි එකකට ලකුණු 1 යි
(පිළිතුරු දෙකකට වඩා සපයා ඇති ඇති විට 1 ක් අඩු කරන්න)

09. රූපයේ දී ඇති තොරතුරුවලට අනුව O කේන්ද්‍රය වූ වෘත්තයේ විෂ්කම්භයේ දිග සොයන්න



$5cm \times 2 = 10cm$ —— (2)

---

10. රූපයේ දක්වා ඇති කෝණ අතරින් මහා කෝණය නිවැරදිව හඳුනාගෙන නම් කරන්න.

$A\hat{B}D$ —— (2)



---

11. 21 වෙනි සියවසේ ආරම්භක දිනය කවදාද ?

2001-01-01 —— (2)

---

12. සුළු කරන්න. (-11) + (+5)

=(-6) —— (2)

---

13. පහත දක්වා ඇති සිදුවීම් අතරින් අහඹු සිදුවීම් ඉදිරියේ ඇති කොටු තුල ✓ ලකුණු යොදන්න.

i.	අමාවක දිනක චන්ද්‍රයා දිස්වීම.	☐
ii.	පන්තියට ඊලගට ඇතුල්වන ළමයා, පිරිමි ළමයකු වීම.	✓
iii.	අද දිනය තුල වැසි ලැබීම.	✓
iv.	නැගෙනහිරෙන් ඉර උදාවීම.	☐

නිවැරදි පිළිතුරු දෙකට ලකුණු 2 යි
නිවැරදි එකකට ලකුණු 1 යි
(පිළිතුරු දෙකකට වඩා සපයා ඇති ඇති විට 1 ක් අඩු කරන්න) —— (2)

14.

	l	ml
	6	15
-	2	78
	3	937

—— (2)

---

15. දක්වා ඇති රූප අතරින් අවතල බහුඅස්‍ර තෝරා යටින් ඉරි අඳින්න.

i. 

ii.

iii. 

iv  —— (2)

නිවැරදි පිළිතුරු දෙකට ලකුණු 2 යි
නිවැරදි එකකට ලකුණු 1 යි
(පිළිතුරු දෙකකට වඩා සපයා ඇති ඇති විට 1 ක් අඩු කරන්න)

---

16. බිස්කට් පැකට්ටුවක ස්කන්ධය 50g 170mg වේ. එවැනි බිස්කට් පැකට් අටක ස්කන්ධය සොයන්න.

	g	mg
	50	170
×		8
	401	360

—— (1)
—— (1)

---

17. සුළු කරන්න $123.45 \div 100 = 1.2345$ —— (2)

18. $3m$ දිග රිබන් පටියකින් $1m$ $17cm$ ක කොටසක් කපා ඉවත්කළ පසු ඉතිරිවන කොටසේ දිග සොයන්න.

	m	cm	
	3	00	
(1)	- 1	17	
	1	83	(1)

19. දක්වා ඇති ඝනකාභයේ පරිමාව කීයද?



පරිමාව = දිග × පළල × උස

$= 15 \times 5 \times 2$

$= 150 cm^3$ (2)

20. දී ඇති සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සඳහා ප්‍රකාශනයක් ලියා, එය සුළු කර දක්වන්න.



පරිමිතිය $= 2x + 2x+3 + 2x + 2x +3$ (1)

$= 8x + 6$ (2)

40

ii කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.
- මෙහි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට ඉඩකට ප්‍රමාණවත් නොවන්නේ නම් පමණක් ඒ සඳහා අමතර කඩදාසි භාවිතා කරන්න.

01. (*a*). පහත දක්වා ඇති කාටීසිය තලය හොඳින් අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. A , B, D ලක්ෂවල ඛණ්ඩාංක නිවැරදිව ලියන්න.

A = ..(5,9)............... 1

B = ...(2,4)............... 1

E = .(5,0)............... 1 (ල 03)

ii. A, B, C, D, E ලක්ෂ අනුපිළිවෙලින් යා කරන්න. (ල 01)

iii. AE සරල රේඛාව කඩ ඉරකින් යා කරන්න (ල. 01)

iv. ඉහත ඔබ ඇඳි AE කඩ ඉර සමමිති අක්ෂයක් ලෙස සලකා ද්වීපාර්ශ්වික තල රූපයක් ලැබෙන සේ දී ඇති කාටීසියතලය මත ඉතිරි කොටස සම්පූර්ණ කරන්න (ල. 02)



(*b*). ඔබ පන්තියේදී කළ ඝන වස්තු පාඩම සිහිපත් කරන්න.

i. ඉදිරියෙන් දක්වා ඇති පතරම භාවිතයෙන් සෑදිය හැකි ඝන වස්තුවේ නම ලියන්න. ..ත්‍රිකෝණ ප්‍රිස්මය............... 1 (ල. 01)

ii. එම ඝන වස්තුවේ මුහුණත්, දාර, ශීර්ෂ ගණන වෙන වෙනම ලියා දක්වන්න



මුහුණත් ගණන = ...05....... 1

දාර ගණන = ...09........ 1

ශීර්ෂ ගණන = ...06........ 1 (ල. 03)

(*c*).

i. ඔබ ඉහත පතරම භාවිතයෙන් සාදාගත් ඝනවස්තුවේ ත්‍රිකෝණාකාර මුහුණතට සමාන මුහුණත් ඇති සවිධි චතුස්තලයක් ඔබට සපයා ඇත. එම චතුස්තලය ඔබ ඉහත සාදන ලද ඝන වස්තුවේ ත්‍රිකෝණාකාර මුහුණතට සමපාත වනසේ තබා අලවා ගත් පසු ලැබෙන සංයුක්ත ඝන වස්තුවේ මුහුණත්, දාර, ශීර්ෂ ගණන වෙන වෙනම ලියා දක්වන්න (ල. 03)

මුහුණත් ගණන = ..07........... 1

දාර ගණන = ..12........... 1

ශීර්ෂ ගණන = .07........... 1

ii. ඉහත සැදි සංයුක්ත ඝණවස්තුව ඔයිලර් නියමය පිළිපදින බව පෙන්වන්න. (ල. 03)

මුහුණත් ගණන + ශීර්ෂ ගණන = දාර ගණන + 2 — 1

07 + 07 = 12 + 2 ⇨ 14 = 14

1 1

16

02. i. කවකටුව භාවිතයෙන් අරය 4 cm වන වෘත්තයක් නිර්මාණය කර එහි කේන්ද්‍රය O ලෙස නම් කරන්න. (ල. 02)

ii. ඔබ ඇඳි වෘත්තය මත කවකටුව භාවිතයෙන් A, B, C, D, E, F සවිධි ෂඩාස්‍රය නිර්මාණය කරන්න (ල. 05)

iii. ෂඩාස්‍රයේ A, C, E ලක්ෂ යා කිරීමෙන් ත්‍රිකෝණයක් ලැබෙන සේ යා කරන්න. (ල. 01)

iv. ACE ත්‍රිකෝණය පාද අනුව කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද? **සම පාද ත්‍රිකෝණයක්** (ල 01)

v. $A\hat{C}E$ කෝණයේ අගය මැන ලියන්න. **60^0** (ල. 02)

(අදාල නිර්මාණයට පහත සපයා ඇති ඉඩ ප්‍රයෝජනයට ගන්න)



11

03. i. $5\frac{2}{3}$ විෂම භාගයක් ලෙස ලියන්න. (ල. 2)

$\frac{17}{3}$ — (2)

ii. පිළිතුර ලබාගත් ආකාරය දක්වමින් හිස්තැන සඳහා < , > මෙම සලකුණුවලින් සුදුසු සලකුණ යොදන්න

$5\frac{2}{3}$ ..$>$.. $5\frac{3}{5}$ — (3) (ල. 3)

$5\frac{10}{15} > 5\frac{9}{15}$

iii. $\frac{2}{3} + \frac{1}{2} + \frac{5}{6}$ සුළු කරන්න (ල. 3)

$\frac{4 + 3 + 5}{6}$ (1) $= \frac{12}{6}$ (1) $= 2$ (1)

v. $5\frac{2}{3} - 1\frac{5}{6}$ සුළු කරන්න (ල. 3)

$\frac{17}{3} - \frac{11}{6}$ (1) $= \frac{34}{6} - \frac{11}{6} = \frac{23}{6}$ (1) $= 3\frac{5}{6}$ (1)

11

04. (a)

i. මෙහි දැක්වෙන සෘජුකෝණාස්‍රයේ දිග, පළලට වඩා මීටර් 5 ක් වැඩිවේ. මෙහි පළල මීටර් a වේ. එහි දිග සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න . (ල. 01)

$a + 5$ — (1)



ii. එම සෘජුකෝණාස්‍රයේ පරිමිතිය P නම්, පරිමිතිය දැක්වීමට වීජීය පද ඇතුළත් ප්‍රකාශනයක් ලියා සුළු කරන්න (ල. 3)

$P = a + 5 + a + a + 5 + a = 4a + 10$ — (3)

iii. $a = 8\ m$ නම් සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න. (ල. 2)

$P = 4a + 10 = 4 \times 8 + 10 = 32 + 10 = 42\ m$

(1) (1)

(b)

i. පොතක මිල රු. x වේ. එවැනි පොත් තුනක් හා රු. 25 ක් වන පෑන් දෙකක් මිලට ගැනීමට අවශ්‍ය වන මුළු මුදල දැක්වීමට x අඩංගු ප්‍රකාශනයක් ලියන්න. ....3x + 50......... (ල. 02)

(2)

ii. ඉහත ද්‍රව්‍ය සියල්ල මිලට ගැනීමට වැය වූ මුළු මුදල රු. 350 ක් නම්, ඒ සඳහා සමීකරණයක් ගොඩනගා එය විසඳීමෙන් පොතක මිල සොයන්න. (ල. 03)

$3x + 50 = 350$ — (1)

$3x = 350 - 50$

$3x = 300$ — (1)

$x = 100$ — (1)

11

05. වසර කිහිපයකදී කන්ද ලඟ පාසලේ සමාන්‍ය පෙළ විභාගයෙන් ගණිතය, විද්‍යාව හා සිංහල යන විෂයන් සමත් සිසුන් ගණන පිළිබඳ තොරතුරු ඇතුලත් අසම්පූර්ණ බහු තීර ප්‍රස්තාරයක් පහත දැක්වේ.



i. 2020 වර්ෂයේ සමත් වූ සිසුන් පහත පරිදි වේ.
සිංහල සමත් සිසුන් 80, ගණිතය සමත් සිසුන් 85, විද්‍යාව සමත් සිසුන් 50
මෙම තොතුරු ඉහත ප්‍රස්තාරය මත නිවැරදිව නිරූපනය කරන්න. (ල. 03)

ii. වසරක් පාසා සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය වී ඇත්තේ කවර විෂයේ ද? **ගණිතය** (2)
(ල. 02)

iii. වසරක් පාසා සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වී ඇත්තේ කවර විෂයේ ද? **සිංහල** (2) (ල. 02)

iv. 2019 වර්ෂයේ විද්‍යා විෂයට වඩා ගණිතය විෂය සමත් සිසුන් ගණන කොපමණ ද? (ල. 02)

70 - 55 = 15 (2)

v. වසර 3 තුල ම විද්‍යාව විෂය සමත් වූ මුළු සිසුන් ගණන කීයද ? (ල. 02)

30 + 55 + 50 = 135 (2)

11

06. මෙහි ABCDEF ලෙස දක්වා ඇත්තේ මල් පාත්තියකි. මෙම මල් පාත්තිය වටා ගඩොල් බැම්මක් සකස් කිරීමට යෝජිතය.



i. CD, BC, දිග සෙන්ටි මීටර්වලින් කොපමණද?

CD = ...3 m..

BC = ..1 m...... (2)

(ල. 02)

ii. ගඩොල් බැම්මේ මුළු දිග සොයන්න. (ල. 02)

$2(2+4) = 12\,m$ (2)

iii. මල් පාත්තියේ මුළු වර්ගඵලය ගණනය කරන්න. (ල. 05)

A හි වර්ගඵලය = $2m \times 1m$ $= 2\,m^2$ (2)

B හි වර්ගඵලය = $3m \times 1m$ $= 3\,m^2$ + (2)

මුළු වර්ගඵලය = $= 5\,m^2$ (1)

11

07. i. හිස් තැන පුරවන්න. 2 : 5 = ...6... : 15 (1) (ල. 01)

ii. එක්කරා පොහොර වර්ගයක් සෑදීම සඳහා පොස්පරස් හා පොටෑසියම් යන මූල ද්‍රව්‍ය 5 : 3 අනුපාතයට මිශ්‍ර කරයි.

පොහොර මිශ්‍රණයේ පොටෑසියම්වල ස්කන්ධය 600 g නම්, මිශ්‍රනයේ මුළු ස්කන්ධය සොයන්න (ල 04)

$$600 \times \frac{5}{3} = 1600\ g$$ (2) (2)

iii. උසස් පෙළ සිසුන් කලා, වාණිජ, ගණිත අංශ සඳහා 2 : 5 : 3 අනුපාතයට බඳවාගන්න ලදී. උසස් පෙළ සඳහා ඉහත විෂය ධාරාවන්ගෙන් ඇතුලත් කළ මුළු සිසුන් 240 ක් නම් ඒ ඒ විෂය ධාරවලට ඇතුලත් වූ සිසුන් ප්‍රමාණයන් වෙන වෙනම සොයන්න. (ල 06)

කලා අංශයට ඇතුලත් වූ සිසුන් = $240 \times \frac{2}{10} = 48$ (2)

කලා අංශයට ඇතුලත් වූ සිසුන් = $240 \times \frac{5}{10} = 120$ (2)

කලා අංශයට ඇතුලත් වූ සිසුන් = $240 \times \frac{3}{10} = 72$ (2)

11

LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න